# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 761/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 05/05/2024<br>පැය 1805 |

## මාධ්‍ය නිවේදනය

**පොලිස් නිලධාරීන්ගේ සතිමත් බව වර්ධනය කිරීමේ වැඩසටහනක් - ප්‍රජා පොලිස් කොට්ඨාසය.**

පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ සංකල්පයක් මත ප්‍රජා පොලිස් කොට්ඨාසයේ සම්බන්ධීකරණයෙන් පොලිස් නිලධාරීන්ගේ සතිමත් භාවය (මනා සිහිය හා නිසි අවධානය) වර්ධනය කිරීමේ අරමුණින් දීප ව්‍යාප්තව වැඩසටහන් ගණනාවක් පැවැත්වීම සඳහා කටයුතු සංවිධානය කර ඇත.

මෙම සතිමත් භාවය වර්ධනය කිරීමේ වැඩසටහනේ සමාරම්භක වැඩසටහන එහි නිර්මාතෘ අතිපූජ්‍ය උඩර්රියගම ධම්මජීව ස්වාමින් වහන්සේ , තවත් ස්වාමින් වහන්සේලා සිව්නමකගේ සහ පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ ප්‍රධානත්වයෙන් 2024.05.05 වන අද දින උදෑසන කළුතර පොලිස් විද්‍යාලයේදී, පුහුණුව ලබමින් සිටින ආධුනික පොලිස් නිලධාරීන් හා එම කාර්ය මණ්ඩලයේ දහසකට ආසන්න නිලධාරීන් පිරිසකගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

මෙමඟින් පොලිස් නිලධාරින්ගේ රාජකාරි නිසි අයුරින් පවත්වාගෙන යාමට මහත් රුකුලක් වන බව වැඩමවා වදාල අතිපූජ්‍ය උඩර්රියගම ධම්මජීව ස්වාමින් වහන්සේ දේශනා කරන ලදී. එහිදී පොලිස්පතිතුමා විසින් පැමිණ සිටි පිරිස ආමන්ත්‍රණය කරමින්, මෙම වැඩසටහන් මාලාව හරහා පොලිස් නිලධාරීන්ගේ මානසික පීඩනය හා විවිධ ගැටලුකාරී තත්වයන් සඳහා නිවැරදි මනසකින් යුක්තව මුහුණ දීමටත් ගැටලු නිරාකරණය කර ගැනීමට මෙන්ම එවැනි ගැටලුකාරී තත්වයන් ඇති නොවන ආකාරයට කටයුතු කිරීමට හැකිවන බවටත් ප්‍රකාශ කරන ලදී . එමෙන්ම ඉදිරියේදී ප්‍රජා පොලිස් කොට්ඨාසය සමග සම්බන්ධ වී සියලුම පොලිස් කොට්ඨාසයන් වල මෙම වැඩසටහන පැවැත්වීමට කටයුතු කරන බවටද පොලිස්පතිතුමා වැඩිදුරටත් සඳහන් කරන ලදී.

මෙම අවස්ථාව සඳහා ගරුතර මහා සංඝරත්නය, සබරගමුව පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සංජීව ධර්මරත්න මහතා , ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති පුහුණු හා උසස් පුහුණු සජීව මැදවත්ත මහතා, නියෝජ්‍ය පොලිස්පති ශිෂ්‍ය භට දිසාව එස්.කේ. සෙනවිරත්න මහතා, නියෝජ්‍ය පොලිස්පති ප්‍රජා පොලිස් දිසාව ජගත් සේරම් මහතා සහ පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ජේ.ඒ චන්ද්‍රසේන මහතා ඇතුළු ඇතුලුනිලධාරීන් පිරිසක් සහභාගී විය.

මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක්









